**Freedom from Torture**
Medical Foundation for the Care of Victims of Torture

111 Isledon Road London N7 7JW
**t** 020 7697 7777 **f** 020 7697 7799
**w** freedomfromtorture.org
facebook.com/freedomfromtorture
twitter.com/freefromtorture

## SINHALA

දූෂිත වූ සාමය: 2009 මැයි මාසයේ සිට ශ්‍රිලංකාව තුළ සිදු වූ වධහිංසා - සිංහල භාෂාවෙන් සංක්ෂිප්ත සටහනක්

පුනරුත්ථාපනය වෙත අපගේ සාකල්‍ය ප්‍රවේශයේම කොටසක් වශයෙන්, Freedom from Torture, අප විසින් වාර්තාගත කර ඇති සාක්ෂි විශ්ලේෂණය කිරීමෙන්ද හුවමාරු කරගැනිමෙන්ද වධහිංසා වලට ලක්ව බේරී ඇති පුද්ගලයන්ගේ අයිතීන් සුරැකීමටත් ප්‍රවර්ධනය කිරීමටත් බලාපොරොත්තු වේ. විශේෂයෙන්ම ගත් කල, වධහිංසා වළක්වාගැනීමේ අන්තර්ජාතික ප්‍රයත්නයන් වලට දායක වෙමින් අපගේ වෛද්‍ය-නීතික වාර්තා ("MLRs" නමින් හඳුන්වනු ලබන) වල අඩංගු වන අධිකරණ වෛද්‍ය සාක්ෂි භාවිතා කොටගෙන අපරාධකරුවන් වෙත වරද පැටවීමට අපි අපේක්ෂා කරනෙමු.

2015 වසරේ අගෝස්තු මාසයේදී, දූෂිත වූ සාමය: 2009 මැයි මාසයේ සිට ශ්‍රිලංකාව තුළ සිදු වූ වධහිංසා - සිංහල භාෂාවෙන් සංක්ෂිප්ත සටහනක් යනුවෙන් වාර්තාවක් අපි පළ කළෙමු. මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා, පොලිසිය සහ බුද්ධි අංශ සේවා විසින් සිදු කළ වද හිංසා පාදක වූවකි. මෙය Freedom from Torture ආයතනය විසින් ශ්‍රී ලංකාවේ සිදුවූ වද හිංසා 148ක් සම්බන්ධයෙන් සිදු කරන ල ද්දක් වන අතර එය වදහිංසා සහ වෙනත් ක්‍රෑර, අමානුෂික හෝ පහත් සැලකිලි හෝ දඬුවම් පිළිබඳ ඵලදායී ලෙස විභාග කිරීමේ සහ වාර්තා කිරීමේ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශය (‘ඉස්තාන්බුල් ප්‍රොටොකෝලය‘ යනුවෙන් හැඳින්වේ) විසින් දක්වා ඇති ප්‍රමිතීන් අනුව අපේ වෛද්‍ය නෛතික සේවයේ විශේෂඥ වෛද්‍යවරුන් විසින් අධිකරණ වෛද්‍යමය වශයෙන් ලබා ගත් වාර්තා අනුව කරන ලද සකස් කරන ලද්දකි.

මෙම පර්යේෂණය පර්යේෂණ කටයුතු සඳහා සිය වෛද්‍ය නෛතික වාර්තා භාවිතා කිරීමට එකඟතාව පළ කළ ගනුදෙනුකරුවන් සහ ශ්‍රී ලංකාවේ වධ හිංසා සහ රඳවා තබා ගැනීම් පිළිබඳ නිරීක්ෂණ සැපයූ Survivors Speak OUT ජාලය සමග වැඩ කළ අනෙක් ගනුදෙනුකරුවන් සමග සිදු කරන ලද්දකි.

බහු මාධ්‍ය අන්තර්ගතද සහිත අපේ සම්පූර්ණ සහ සාරාංශගත සංස්කරණ සහ දිවි ගලවා ගැනීමේ කතා ඉංග්‍රීසි භාෂාවෙන් interactive web hub හරහා ලබා ගත හැක.

සිදුවීම් 148ම 2009 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන සමයේ සිදු වූ වධ හිංසා සම්බන්ධ ඒවා වන නමුත් 2014, 2015 වැනි වඩාත් මෑත කාලීන ඒවාද Freedom from Torture වෙත යොමු කර ඇත. 2014, වර්ෂයේ සිට එක දිගට තෙවන වරටත් සායනික සේවා සඳහා Freedom from Torture වෙත යොමු කරන ලද පුද්ගලයන් සිටි වැඩිම රට ශ්‍රී ලංකාව විය.

අපේ පර්යේෂණ අනුව පෙනී යන්නේ සටන් නැවතු නමුත් වධ හිංසා නොනැවතුන බවයි. දූෂණ සහ වෙනත් ලිංගික වධ හිංසා, දැඩි පිළිස්සීම් සහ ශාරීරික පහර දීම් ද ඇතුළු වධ හිංසා ශ්‍රී ලංකාවේ යටපත් කිරීමේ යාන්ත්‍රණයේ කොටසක්ව පවතින අතර දිගටම නිදහසේ සිදු වෙමින් පවතියි. අපරාධකරුවන් ගැන වාර්තා කිරීමේ නිසි ක්‍රියාවලියක් නොමැති කම සහ වින්දිතයන්ගේ ශරීරවල ඇති දැඩි කැළැල් අනුව උපකල්පනය කළ හැකි පරිදි අපරාධකරුවන් ප්‍රතිඵල පිළිබඳ කිසිඳු බියකින් තොරව වධ හිංසා සිදු කරන බව පෙනේ. විශේෂයෙන්ම වද හිංසාවන්ට ලක් වීමේ අවදානමට ලක් ව සිටින්නන් අතර වර්තමානයේ හෝ අතීතයේදී දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) සමඟ කවර හෝ මට්ටමකින් සම්බන්ධතා පැවැත්වූ හෝ පවත්වා ඇතැයි සිතන අය ඇතුළත් වෙති.

මේ අධ්‍යයනයේ දක්වා ඇති දිවි ගලවා ගත් අය වෙත වධ හිංසා හේතුවෙන් සිදුව ඇති විනාශකාරී බලපෑම අති මහත් ය: සිදුවීම් 148දීම විශාල මානසික බලපෑම් පිළිබඳ සාක්ෂි දක්නට ලැබුනි. ඒවාට වින්දිතයන් සෑහෙන ගණනක් තුළ PTSD (පශ්චාත් වේදනා විශාදය) සහ විශාදයෙන් ඇතිවන රෝග ලක්ෂණ දිගටම දක්නට ලැබීමද ඇතුළත් විය.

Freedom from Torture ආයතනයේ විශේෂ අවධානයට ලක් වූයේ මේ අධ්‍යයනයට ලක් වූවන්ගෙන් තුනෙන් එකකටත් වඩා ශ්‍රී ලංකාවේ සන්නද්ධ යුද්ධය අවසන් වීමෙන් පසු එක්සත් රාජධානියෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව රඳවා තබාගෙන වධ හිංසාවට ලක් කරනු ලැබීමයි. (148කින් 55ක් හෝ 37%ක්).

දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ සිටි දේශපාලන නායකයන් වෙතින් වධ හිංසාවට ලක්වූ ශ්‍රී ලාංකිකයන් ගණනාවක් සමඟ අපි කටයුතු කර ඇත්තෙමු. මේ පළපුරුද්ද අනුව වධ හිංසාව යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යුහය හා බද්ධ වූ කොටසක් බව අපි දනිමු. ශ්‍රී ලංකාවෙන් වධ හිංසාව තුරන් කිරීමට නම් බලය පවරා දීමේ අභියෝග ඇතුළු විප්ලවීය වෙනසක් සිදු විය යුතුය. මෙය 2015 ජනවාරි මාසයේදී ජනාධිපතිවරයා වෙනස් වීම වැනි දේශපාලන වෙනස්කම් සිදු වුවද තවමත් එය සිදු කිරීමට හැකියාවක් ලැබී නැත.

මෙම වාර්තාවේ දක්වා ඇති නිර්දේශ සහ සාකච්ඡා ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකාවේ වධ හිංසාවලින් දිවි ගලවා ගත් අය සමඟ Survivors Speak OUT ජාලය සහ Freedom from Torture විසින් කරන ලද සාකච්ඡා ඇසුරෙනි. අප පහත සඳහන් නිර්දේශ ඉතා වැදගත් කොට සලකමු:

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ සහ ආරක්ෂක මණ්ඩලයේ සාමාජික රටවල් වින්දිතයන්ගේ විනිවිදභාවය, ස්වාධීන බව සහ ඔවුන් වෙත ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් උපරිම ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කරන බවට වූ නියම වගවීමේ ක්‍රියාවලියක් ඇති කරන බවට වග බලා ගත යුතුය. මේ ක්‍රියාවලිය මඟින් යුද්ධය අවසන් වීමෙන් පසුව 'සාමය' පැවති වර්ෂවල සන්නද්ධ අරගලයට සහභාගී වූ දෙපාර්ශවය විසින්ම කළ වධ හිංසා සහ වෙනත් මානව හිමිකම් කඩවීම් සහ ඒ හා අදාළ ජාත්‍යන්තර අපරාධ ආවරණය විය යුතුය.

ශ්‍රී ලංකාව  වධ හිංසනයට චෝදනා ලැබූවන්ගේ බලය, දේශපාලන, හමුදා සහ ආරක්ෂක ආයතනවල ජ්‍යෙෂ්ඨත්වය කවරක් වුවද ඔවුන්ගේ රාජකාරිය අත්හිටුවීමෙන් සහ ඔවුන්ට එරෙහිව අපරාධ පරීක්ෂණ ආරම්භ කිරීමෙන් සහ නඩු පැවරීමෙන් වධ හිංසාව 'නොඉවසීමේ' ප්‍රතිපත්තිය යථාර්තයක් කිරීමට දායක විය යුතුය.

ලිංගික වධහිංසාව සඳහා වූ නිදහස මුලිනුපුටා දැමීමේ ප්‍රයත්නයේදී ලිංගික ප්‍රචණ්ඩත්වය ලේඛනගත කිරීමේ සහ විභාග කිරීමේ ජාත්‍යන්තර ප්‍රොටොකෝලය භාවිත කිරීමද ඇතුළුව, ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සක්‍රිය පාර්ශවකරුවකු බවට පත් විය යුතුය. මෙයට කවර හෝ ආකාරයක ලිංගික වධ හිංසාවලින් දිවි ගලවා ගත් අය ද විශේෂඥ ආකාරයකින් සහභාගී කරවා ගැනීම ද ඇතුළත් විය යුතුය.

වධ හිංසනයට එරෙහි ප්‍රඥප්තියට සම්බන්ධවෛකල්පිත ප්‍රොටොකෝලය ශ්‍රී ලංකාව බලාත්මක කළ යුතු බවත් හමුදා, පොලීසිය සහ බුද්ධි අංශ සේවා තුළ සිදු කරන පෘථුල පුහුණුව ද ඇතුළුව ඵලදායී වධ හිංසන වැළැක්වීමේ වැඩසටහනක් ස්ථාපිත කළ යුතු බවටත් ස්වාධීන ජාතික සහ ජාත්‍යන්තර විමර්ශකයන් හට නිල නොවන රැඳවුම් මධ්‍යස්ථාන ද ඇතුළුව කිසියම් රැඳවුම් මධ්‍යස්ථාන වෙතොත් ඒවා නිරන්තරව සහ කලින් දැනුම් නොදී පරීක්ෂණ සිදු කිරීමට හැකි වන අන්දමේ ක්‍රියාමාර්ග ගත යුතු බවටත් බල කරනු ලැබේ.

මෙම වාර්තාවේ සඳහන් සාක්ෂිවලින් පිළිබිඹු වන පරිදි  ලංකාව සම්බන්ධයෙන් සිය රැකවරණ පතන්නන්ගේ ප්‍රතිපත්තිය යාවත්කාල කිරීම ඇතුළුව ශ්‍රී ලංකාවේදී පුද්ගලයින් වධ හිංසාවලට ලක්වීමේ අවදානමක් දැරීමට සිදු වන පරිදි පුද්ගලයන් බලහත්කාරයෙන් එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු නොඑවීමටත් එක්සත් රාජධානිය වග බලා ගත යුතුය.

______

Freedom from Torture පිළිබඳ: Freedom from Torture යනු වධහිංසාවලින් දිවි ගලවා ගත්තවුන්ට ප්‍රතිකාර කිරීම සහ පුනරුත්ථාපනය කිරීම පිළිබඳ කැප වූ එක්සත් රාජධානියෙහි පිහිටි එකම මානව හිමිකම් සංවිධානයයි. අපි වර්ෂයකට වධ හිංසාවලින් දිවි ගලවා ගත්තවුන් 1000ට පමණ එංගලන්තය සහ ස්කොට්ලන්තය පුරා සේවා සපයමු. මෙයට මානසික සහ කායික චිකිත්සාවන්, ව්‍යවහාරික ලේඛනගත කිරීම, නෛතික සහ ශුභ සාධන උපදෙස් සහ නිර්මාණාත්මක ව්‍යාපෘති ද ඇතුළත් වෙති.

Survivor Speak OUT (SSO) යනු එක්සත් රාජධානියේ දිවි ගලවා ගත්තවුන්ගේ එකම ක්‍රියාකාරී ජාලයයි. මෙම සංවිධානය වධ හිංසාවලට විරුද්ධව හඬ නැඟීමේ සහ එහි අනිටු ඵලවලට එරෙහිව හඬ නැගීමේ සක්‍රිය කාර්ය භාරයක් ඉටු කරයි.  වධ හිංසාවලින් දිවි ගලවා ගත්තවුන් විසින් එසේ දිවි ගලවා ගත්තවුන් වෙනුවෙන් පිහිටුවා ගන්නා ලද SSO සංවිධානය වධ හිංසාවලින් දිවි ගලවා ගත්තවුන්ගේ අයිතිවාසිකම් සඳහා බලය ඇති කිරීම වෙනුවෙන් සිය සමීපතම අත්දැකීම් භාවිත කරයි. මෙම ජාලයට Freedom from Torture හි සහයෝගය සහ පහසුකම් ලැබෙන අතර එහි සියලු සාමාජිකයන් Freedom from Torture හි පූර්ව ගනුදෙනුකරුවන් ය.

Freedom from Torture සහ Survivors Speak OUT ජාලය ගැන වැඩිදුර විස්තර (ඉංග්‍රීසියෙන්) දැන ගැනීමට www.freedomfromtorture.org යන වෙබ් අඩවිය වෙත යන්න.

එසේ නැති නම්Twitter @FreefromTorture මඟින් හෝ @SSOonline
මඟින් හෝ Facebook මඟින් https://www.facebook.com/FreedomfromTorture හරහා අප හා සම්බන්ධ වන්න